**ප්‍රවාහන ව්‍යාපෘති සූදානම් කිරීමේ පහසුකම් ව්‍යාපෘතිය - උතුරු කොළඹ වරාය සංවර්ධනය සම්බන්ධයෙන් සිදු කරනු ලබන ශක්‍යතා අධ්‍යයනය සඳහා උපදේශන සේවා ව්‍යාපෘතිය - 2023**

---

ප්‍රවාහන ව්‍යාපෘති සූදානම් කිරීමේ පහසුකම් ව්‍යාපෘතියේ - උතුරු කොළඹ වරාය සංවර්ධනය සම්බන්ධයෙන් සිදු කරනු ලබන ශක්‍යතා අධ්‍යයනය සඳහා උපදේශන සේවා ව්‍යාපෘතිය 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2016 ඔක්තෝබර් 28 දින එළඹි අංක 3425-එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ 2.09 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ණය ගිවිසුම අනුව, වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ශ්‍රී ලංකා වරාය අධිකාරිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ ප්‍රමුඛතා ප්‍රවාහන ව්‍යාපෘතිවල සූදානම වැඩිදියුණු කිරීම වන අතර ණය ගිවිසුමේ ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව ජාතික වරාය ප්‍රධාන සැලැස්ම අනුගමනය කරමින් වරාය පහසුකම් සංවර්ධනය සඳහා සූදානම් වීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියට සහාය වේ.

ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 729.65 කට සමාන වූ එ.ජ.ඩො. මිලියන 5 ක් වන අතර එයින් රු.මිලියන 643.77 කට සමාන වූ එ.ජ.ඩො. මිලියන 4.42 ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යකරණය කිරීමට එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු. මිලියන 84.64 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යකරණය කිරීමට අපේක්ෂා කෙරේ.

ව්‍යාපෘතිය එහි කටයුතු 2020 පෙබරවාරි 24 වන දින ආරම්භ කර 2021 මැයි 23 වන දින වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කරන දිනය 2023 මැයි 31 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මතය

2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශය සහ එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිලිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීතිරීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම / විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ව්‍යාපෘතියේ තාක්ෂණික උපකාරක ණය ගිවිසුමේ IV පරිච්ඡේදයේ (විශේෂ ගිවිසුම්) 4.01 | ණය ගැනුම්කරු විසින් ණය ගිවිසුම සහ ව්‍යාපෘති ගිවිසුම් සඳහා වන 5 වන උපලේඛනයේ දක්වා ඇති හෝ ඉටු කිරීමට ඇති සියලුම බැඳීම් ඉටු කිරීමට වග බලා ගත යුතුය. ඒ අනුව, 2016 ඔක්තෝම්බර් 28 දිනැති ණය අංක 3425 SRI (SF) හි 5 වන | එකඟ වේ. | ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම සඳහා වගකීම් ඇතුළත් කරමින් පුළුල් සැලැස්මක් ව්‍යාපෘති කළමනාකරණ |

| | | |
|---|---|---|
| වගන්තිය | උපලේඛනයේ ක්‍රියාත්මක කිරීමේ විධිවිධාන සහ ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි සමස්ත ව්‍යාපෘති සැලැස්ම අනුව උතුරු කොළඹ වරාය සංවර්ධනය සම්බන්ධයෙන් සිදු කරනු ලබන ශක්‍යතා අධ්‍යයනය සඳහා උපදේශන සේවා ව්‍යාපෘතිය සහ එහි සවිස්තරාත්මක ඉංජිනේරු කටයුතු 2020 වසරේ 2 වන කාර්තුව වන විට අවසන් කිරීමට සැලසුම් කරන ලදී. කෙසේ වුවද, ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රමාද කිරීම හේතුවෙන් 2020 පෙබරවාරි 24 වන දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලදී. ඒ අනුව, උතුරු කොළඹ වරාය සංවර්ධනය සම්බන්ධයෙන් සිදු කරනු ලබන ශක්‍යතා අධ්‍යයනය සඳහා උපදේශන සේවා ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත්තුව AECOM Infrastructure & Environment UK Limited වෙත GBP මිලියන 0.85, ඇ.එ.ජ. ඩොලර් මිලියන 2.03 සහ රු. මිලියන 66.17 ක සම්පූර්ණ ඇගයීම් සහ සාකච්ඡා කරන ලද කොන්ත්‍රාත් මිලකට 2020 පෙබරවාරි 24 දින ලබා දුන් අතර එය එදින සිට මාස 15ක් ඇතුළත අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වුවද, සැලසුම් කළ පරිදි 2021 මැයි 23 වන දින වන විට කොන්ත්‍රාත්තුව අවසන් කර නොතිබුණු අතර 2023 මැයි 31 දින දක්වා දීර්ඝ කරන ලදී. | ඒකකය විසින් සකස් කළ යුතු අතර අවසාන පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව යාවත්කාලීන කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| උපදේශන ගිවිසුමට අනුව, වාර්තා කිරීමේ අවශ්‍යතා 02 වගුවේ නියම කර ඇති අවසාන දිනය යටතේ අපේක්ෂිත ප්‍රතිඵල සහ වාර්තා ඉදිරිපත් කළ යුතු අතර, දී ඇති වගුවට අනුකූලව මන්සංධි ගෙවීම් ද සිදු කළ යුතුය. අවසාන පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව මහජන විමසීම් සඳහා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත | උපදේශකයා විසින් අධ්‍යයනයන් සම්පූර්ණ කර අවසාන පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව සහ ශක්‍යතා අධ්‍යයන වාර්තාව ඉදිරිපත් කර ඇත. විෂයය නීර්ණ පත්‍රිකාව (TOR) අවශ්‍යතාවයට අනුව ශක්‍යතා අධ්‍යයන වාර්තාව ආසියානු සංවර්ධන බැංකුව වෙත ඔවුන්ගේ එකඟතාවය සඳහා යොමු කර ඇත.<br><br>කැලණි ගඟ මෙම පාරිසරික බලපෑම් ඇගයීම් අධ්‍යයනයේ වඩාත් සංවේදී කොටසක් වන අතර තාක්ෂණික ඇගයීම් කමිටුවේ ප්‍රමුඛ පාර්ශවකරුවෙකු ලෙස වාරිමාර්ග දෙපාර්තමේන්තුව මෙම පාරිසරික බලපෑම් ඇගයීම් අධ්‍යයනයේ ප්‍රතිඵල පිළිබඳව සමාලෝචනය කර අදහස් ඉදිරිපත් කිරීමට බොහෝ කාලයක් ලබා ගෙන ඇත. සැලකිය යුතු කාලයක් ගත වූ මෙම අධ්‍යයනය සමාලෝචනය කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ | ඉලක්ක සපුරා ගැනීම සඳහා වාර්තා කිරීමේ අවශ්‍යතා සපුරාලිය යුතුය. |

| | |
|---|---|
| යොමු කර ඇත. කෙසේ වෙතත්, මහජන විමසීම් වාර්තාව 2023 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි. | වාරිමාර්ග දෙපාර්තමේන්තුව සමඟ අතිරේක රැස්වීම් කිහිපයක් උපදේශකවරුන් සමඟ පවත්වන ලද අතර එහිදී අදාළ ආකෘති නිර්මාණ තොරතුරු ද ඔවුන් සමඟ බෙදා ගන්නා ලදී.<br><br>ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් යම් කොන්දේසි සමඟ අදහස් ලැබීමෙන් පසු, එම අදහස් අවසාන පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාවට ඇතුළත් කර ඇති අතර, විෂයය නිර්ණ පත්‍රිකාව (TOR) දක්වා ඇති කොන්දේසිවලට අනුව මහජන විමසීම සිදු කිරීම සඳහා එය සිංහල සහ දෙමළ භාෂාවලට පරිවර්තනය කරන ලදී.<br><br>ඒ අනුව, 2023 දෙසැම්බර් 28 වන දින වැඩකරන දින 30ක කාලයක් සඳහා වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමණාකරණ දෙපාර්තමේන්තුව (CC&CRMD) විසින් මහජන විමසීම ආරම්භ කර ඇති අතර එහිදී 2024 පෙබරවාරි මස මහජන විමසීම් ක්‍රියාවලිය අවසන් කරන ලදී. |

**3.2 පාරිසරික ගැටළු**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| උතුරු කොළඹ වරාය සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී පරිසරයට සහ සමාජයට සිදුවිය හැකි පාරිසරික බලපෑම්, පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව මගින් හඳුනාගෙන ඇත. ඒ අනුව අහිතකර ලෙස බලපෑ හැකි සාධක පිළිබඳව නිරීක්ෂණ පහත දක්වා ඇත.<br><br>i. තරංග තත්වයන්<br>කලාප 2 සහ 4 - වරාය ප්‍රවේශයන් සහ කැලණි ගං මෝයේ භෞතික ව්‍යුහයන් (දියකඩනය සහ ගංගාවේ දිශාව වෙනස් කිරීමේ බැම්ම) පැවතීම හේතුවෙන් තරංග තත්ත්වයේ වෙනස්වීම්.<br><br>ii. වෙරළ රූප විද්‍යාව<br>Littoral Cells 2, 3 සහ 4a - වරාය සිට කැලණි ගං මෝය දක්වා; කැලණි ගඟේ මෝය; සහ ආරක්ෂිත වෙරළ තීරය (ගංගා මෝයෙන් 0-4.2km උතුරින්) හි ව්‍යුහයන් (එනම් දියකඩනය සහ ගංගාවේ දිශාව වෙනස් කිරීමේ බැම්ම) පැවතීම හේතුවෙන් වෙරළ ආසන්නයේ වෙරළාශ්‍රිත රූප විද්‍යාවේ වෙනස්වීම් .<br>කලාප 4 සහ 5-කැලණි ගං මෝය සහ වරායට උතුරේ ව්‍යුහයන් (එනම් දියකඩනය සහ ගංගාවේ දිශාව වෙනස් කිරීමේ බැම්ම) පැවතීම හේතුවෙන් වෙරළාසන්න වෙරළාශ්‍රිත රූප විද්‍යාවේ වෙනස්වීම්. | යෝජිත කොළඹ උතුරු වරාය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ඒකාබද්ධ පාරිසරික සහ සමාජ කළමනාකරණ සැලසුම් රාමුවේ පොදු අවශ්‍යතා දක්වා ඇති පාරිසරික හා සමාජ කළමනාකරණ සැලැස්මක් (ESMP) සකස් කර ඇත.<br><br>ESMP දළ සටහන අදාළ භූමිකාවන් සහ වගකීම්, පුහුණුව, අධීක්ෂණය සහ වාර්තා කිරීම සලකා බලයි; කළමණාකරණය වෙනස්වීම මෙන්ම පාරිසරික සමාජ බලපෑම් තක්සේරු වාර්තාව මගින් හඳුනාගෙන ඇති මෙවැනි විභව පාරිසරික සහ සමාජ බලපෑම් නිසා ඇතිවන අහිතකර බලපෑම් අවම කිරීමේ ක්‍රියාමාර්ග සැපයීම සිදු කරයි.<br><br>ව්‍යාපෘතියේ ක්‍රියාකරු ලෙස ශ්‍රී ලංකා වරාය අධිකාරිය ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සහ අදාළ පාරිසරික සහ සමාජ නෛතික, නියාමන සහ ආයතනික අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කිරීම සඳහා වගකීම දරයි. | පාරිසරික අවදානම අවම කිරීම සඳහා දැඩි අවධානයක් යොමු කරමින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.3 ඌන උපයෝජිත සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශයේ වාර්ෂික අයවැය මගින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (GOSL) සහ ආසියානු සංවර්ධන බැංකුව (ADB) වියදම් යටතේ ව්‍යාපෘති වියදම් සඳහා රු.මිලියන 824ක මුදලක් වෙන් කර තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 552ක් පමණක් වියදම් කර තිබුණි. | වාර්තා ලැබීමෙන් පසු අදියර ගෙවීම් අනුව ගෙවීම් සිදු කෙරේ. අවසාන EIA වාර්තාව ලැබීමෙන් පසු අවසාන ගෙවීම් නිදහස් කරනු ලැබේ. | ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය නිරීක්ෂණය කළ යුතු අතර වර්ෂය තුළ සත්‍ය වශයෙන්ම කළ හැකි කටයුතු සලකා බලා වාර්ෂික ඇස්තමේන්තුව සකස් කළ යුතු බව. |

| | වර්ෂය සඳහා ප්‍රතිපාදන රු. | වර්ෂය සඳහා සත්‍ය වියදම් රු. | ඉතුරුම් රු. |
|---|---|---|---|
| ණය | 737,178,000 | 506,136,839 | 231,041,161 |
| රජයේ දායකය | 86,461,360 | 46,331,709 | 40,129,651 |
| එකතුව | 823,639,360 | 552,468,548 | 271,170,812 |